සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර III විභාගය - 2023 ජූලි

## (301) මූල්‍ය වාර්තාකරණය

(Financial Reporting)

2023-08-19
පෙරවරු
[08.45 – 12.00]

පිටු ගණන : 11
ප්‍රශ්න ගණන : 10

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):
  - (1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
    *උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*
  - (2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***
  - (3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*
  - (4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*
  - (5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*
  - (6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*
  - (7) *ලකුණු 100.*

---

## A කොටස

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී පදනම් කරගන්නා උපකල්පනය සහ මූල්‍ය තොරතුරුවල ගුණාත්මක ලක්ෂණ මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්පනාත්මක ආකෘතිමය රාමුව (Conceptual Framework) මඟින් හඳුනාගෙන තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්පනාත්මක ආකෘතිමය රාමුවට අනුව මූලික ගුණාත්මක ලක්ෂණ දෙක(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(b) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී පදනම් කරගනු ලබන උපකල්පනය **පැහැදිලි කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

### 02 වන ප්‍රශ්නය

කාලයක් පුරා යම් සංවිධානයක් විසින් වටිනාකම් ජනිත කරනු ලබන්නේ කෙසේද යන්න පිළිබඳව මූල්‍ය ප්‍රාග්ධනය සපයන්නන් වෙත පැහැදිලි කිරීමක් සිදුකිරීම සංකලිත වාර්තාකරණයේ (integrated reporting) මූලික අරමුණ වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

සංකලිත වාර්තාවක ප්‍රධාන මූලිකාංග දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

## 03 වන ප්‍රශ්නය

**සීමාසහිත Systech උපදේශන සේවා (පෞද්ගලික) සමාගම,** කාර්මික ඉදිකිරීම් සඳහා සේවාවන් සැපයීමෙහි නිරතව සිටී. සමාගම විසින් සපයනු ලබන සියලුම සේවාවන් රු.7,500,000/- ක මිලකට සැපයීම සඳහා **B ගනුදෙනුකරු** වෙත ගාස්තු යෝජනාවක් ඉදිරිපත් කර ඇත.

සේවාවන් වෙන් වෙන් වශයෙන් සපයනු ලබන්නේ නම්, අයකරනු ලබන ගාස්තු පහත සඳහන් පරිදි වේ:

| | රු. |
|---|---:|
| පස් සාම්පල පරීක්ෂා කිරීමේ සේවාව සඳහා | 500,000 |
| ව්‍යුහගත ඉංජිනේරු සේවාවන් සඳහා | 2,500,000 |
| මූලික ප්‍රමාණ ඇස්තමේන්තු (BOQ) සැකසීමේ සේවාව සඳහා | 3,000,000 |
| යාන්ත්‍රික, විදුලි සහ ජලනල සේවාවන් සඳහා | 2,000,000 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (SLFRS) 15 - ගනුදෙනුකරුවන් සමඟ වන ගිවිසුම්වලින් වන අයභාරය අනුව, එක් එක් සේවාව සඳහා ගනුදෙනු මිල වෙන් කරන ආකාරය **තක්සේරු කරන්න**. (ලකුණු 05)

## 04 වන ප්‍රශ්නය

(a) යම් අස්තිත්වයක මූල්‍ය ප්‍රකාශන, එම අස්තිත්වයේ පසුගිය කාලපරිච්ඡේද සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සමඟත්, අනෙකුත් අස්තිත්වයන්හි මූල්‍ය ප්‍රකාශන සමඟත් සන්සන්දනය කිරීමේ හැකියාව තහවුරු කිරීම සඳහා පොදු අරමුණු සඳහා වන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ පදනම, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) - 1 හි සඳහන් කර ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 1 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම ප්‍රමිතය අනුව වෙනත් විස්තීර්ණ ආදායම්වල සංරචක තුනක් (03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(b) සේවක ප්‍රතිලාභ වර්ග හතරක් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 19 හි හඳුනා ගනියි. ඒවා අතුරෙන් කෙටිකාලීන සේවක ප්‍රතිලාභ, වාර්තාකරනු ලබන කාලපරිච්ඡේදය අවසානයේ සිට මාස 12 ක් ඇතුළත පියවීමට අපේක්ෂා කෙරේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

සේවා සැපයීම වෙනුවෙන් සේවකයින් වෙත ලබාදෙනු ලබන කෙටිකාලීන ප්‍රතිලාභ සඳහා උදාහරණ දෙකක්(02) **හඳුනා දක්වන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

*A කොටසෙහි අවසානය*

# <u>B කොටස</u>

(මුළු ලකුණු 30)

## 05 වන ප්‍රශ්නය

**සීමාසහිත ලක් (පෞද්ගලික) සමාගමේ** 2023 මාර්තු 31 දිනට සහ 2022 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන පහත දක්වා ඇත:

**සීමාසහිත ලක් (පෞද්ගලික) සමාගම**

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශන** *(රු.'000)*

| මාර්තු 31 දිනට | 2023 | 2022 |
|---|---|---|
| **ජංගම නොවන වත්කම්:** | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 20,000 | 13,000 |
| අඩු කළා: සමුච්චිත ක්ෂය | (9,500) | (7,000) |
| **ධාරණ අගය** | **10,500** | **6,000** |
| **ජංගම වත්කම්:** | | |
| තොග | 15,670 | 13,670 |
| වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු මුදල් | 12,750 | 14,780 |
| මුදල් සහ මුදල්වලට සමාන දෑ | 2,800 | 1,900 |
| | **31,220** | **30,350** |
| **මුළු වත්කම්** | **41,720** | **36,350** |
| **ස්කන්ධය සහ වගකීම්:** | | |
| **ස්කන්ධය:** | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 100,000) | 10,000 | 10,000 |
| රඳවාගත් ඉපැයීම් | 2,150 | 1,800 |
| | **12,150** | **11,800** |
| **ජංගම නොවන වගකීම්:** | | |
| දිගුකාලීන ණය | 13,500 | 12,100 |
| සේවක ප්‍රතිලාභ (පාරිතෝෂික සඳහා වෙන්කිරීම) | 4,650 | 4,400 |
| | **18,150** | **16,500** |
| **ජංගම වගකීම්:** | | |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 7,200 | 4,200 |
| කෙටිකාලීන ණය | 2,420 | 2,450 |
| ගෙවිය යුතු පොලී | 500 | 300 |
| ගෙවිය යුතු ආදායම් බදු | 1,300 | 1,100 |
| | **11,420** | **8,050** |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | **41,720** | **36,350** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් බදු වියදම රු.290,000/- ක් වන අතර, බදු හා පොලී පෙර ලාභය රු.1,015,000/- ක් ලෙසද වාර්තා කර ඇත. 2022 ඔක්තෝම්බර් 31 දින සාමාන්‍ය කොටස්හිමියන් සඳහා අතුරු ලාභාංශ ගෙවා ඇත.

(2) පොලී වියදම් මගින් නිරූපණය වනුයේ ණය සඳහා වූ පොලී වන අතර, 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා එය රු.275,000/- ක් විය.

(3) 2022 අප්‍රේල් 01 දින රු. මිලියන 2.75 කට කර්මාන්තශාලා උපකරණයක් විකුණන ලදී. එහි පිරිවැය හා විකුණන ලද දිනට සමුච්චිත ක්ෂය පිළිවෙලින් රු. මිලියන 2.9 ක් හා රු. මිලියන 1.2 ක් විය. විකුණන ලද උපකරණයට ප්‍රතිස්ථාපනයක් (replacement) වශයෙන් 2022 මැයි 01 දින නව උපකරණයක් මිලට ගන්නා ලද අතර, එය එදින සිට ප්‍රාග්ධනීත කරන ලදී.

(4) වර්ෂය තුළදී රු.1,500,000/- ක නව කාරක ප්‍රාග්ධන ණයක් ලබාගන්නා ලදී.

(5) වර්ෂය සඳහා වන පාරිතෝෂික සඳහා වන වෙන්කිරීම් රු.900,000/- ක් විය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සීමාසහිත ලක් (පෞද්ගලික) සමාගමේ** මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වක්‍ර ක්‍රමය යටතේ **පිළියෙල කරන්න.** (ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

(a) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආයතනයක් [Small and Medium Enterprise (SME)] වන **සීමාසහිත Clove Spices (පෞද්ගලික) සමාගම,** 2015 වර්ෂයේදී සිය මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලදී. සමාගමේ කළමනාකරණ අධ්‍යක්ෂවරයා වන **සිල්වා මහතා** පහත සඳහන් කරුණු පැහැදිලි කරගැනීම සඳහා මූල්‍ය උපදේශකයෙකු වෙත යොමු වී ඇත:

(1) තොග මැනීමේදී, සමාගම සියලුම තොග පිරිවැයට අගයකර ඇති නමුත් තොගයෙන් කොටසක් මූල්‍ය වාර්තාකරණ දිනෙන් පසුව ඒවායෙහි පිරිවැයට වඩා අඩු අගයකට විකුණන ලදී.

(2) සමාගම විසින් නව කර්මාන්තශාලා ගොඩනැගිල්ලක් රු. මිලියන 55 ක මුදලකට ඉදිකර ඇත. එය කාලීන ණයක් (term loan) මගින් මූල්‍යනය කර තිබේ. ගොඩනැගිල්ලේ වාණිජ්‍ය මෙහෙයුම් කටයුතු ආරම්භ කරන තෙක් ණය ගැනුම් පිරිවැය වශයෙන් රු. මිලියන 2.75 ක් දරා ඇත.

(3) 2022 අප්‍රේල් 01 දින සිට බලපැවැත්වෙන පරිදි සමාගමේ ක්ෂය කිරීමේ ක්‍රමය, හීනවන ශේෂ ක්‍රමයේ සිට සරල මාර්ග ක්‍රමයට වෙනස්කර ඇත. මෙමගින් සමුච්චිත ක්ෂයවීම් සඳහා ඇතිකරන ලද බලපෑම රු. මිලියන 5.5 කි.

සමාගමේ මූල්‍ය උපදේශක වශයෙන්,

**ඔබ විසින් කළ යුතු දෑ:**

ඉහත එක් එක් කරුණ, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආයතන සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට (SLFRS for SMEs) අනුව, සළකා බැලිය යුත්තේ කෙසේද යන්න **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

(b) **සීමාසහිත XYZ සමාගම,** 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත. 2023 අප්‍රේල් 01 දින සිට බලපැවැත්වෙන පරිදි සමාගමේ ගණකාධිකාරිවරයා වශයෙන් ඔබව පත්කර ඇත.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන පරීක්ෂා කිරීමේදී, ඔබට පහත සඳහන් දෑ නිරීක්ෂණය වී ඇත:

(1) සමාගම විසින් රු. මිලියන 4 ක් පිරිවැය වූ යන්ත්‍රයක් 2021 අප්‍රේල් 01 දින මිලට ගෙන ඇති අතර, එහි ප්‍රයෝජනවත් ආයු කාලය වර්ෂ 5 ක් විය. 2022 අප්‍රේල් 01 දින යන්ත්‍රයේ ප්‍රයෝජනවත් ආයු කාලය නැවත තක්සේරු කර ඇති අතර, එහිදී අනාවරණය වී ඇත්තේ 2022 අප්‍රේල් 01 දිනට යන්ත්‍රයේ ඉතිරි ප්‍රයෝජනවත් ආයු කාලය වර්ෂ 8 ක් බවයි. 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනවල මෙය සැලකිල්ලට ගෙන නොමැත.

(2) 2023 මාර්තු 01 දින, කාර්යාලයේ භාවිතය සඳහා මිලට ගන්නා ලද පරිගණකයක්, කාර්යාල නඩත්තු ගිණුමට අයකර ඇත. පරිගණකයේ පිරිවැය රු.300,000/- ක් වන අතර, එහි ප්‍රයෝජනවත් ආයු කාලය වර්ෂ 4 කි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 8 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි ප්‍රමිතයට අනුව, **සීමාසහිත XYZ සමාගමේ** මූල්‍ය ප්‍රකාශනවලට ඉහත සඳහන් සිද්ධි දෙක මඟින් ඇති කරනු ලබන බලපෑම **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

(මුළු ලකුණු 10)

## 07 වන ප්‍රශ්නය

(a) **සීමාසහිත විෂන් (පෞද්ගලික) සමාගම,** 2022 මැයි 01 දින නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කටයුතු ආරම්භ කරන ලදි. එම ඉදිකිරීමේ කටයුතු, 2023 මාර්තු 31 දින අවසන් කරන ලද අතර, 2022 අප්‍රේල් 01 දින, පහත සඳහන් ණය මුදල්, ඉදිකිරීමේ පිරිවැය මූල්‍යනය කිරීම සඳහා ලබාගෙන ඇත:

| බැංකුව | ණය මුදල (රු.) | වාර්ෂික පොලී අනුපාතිකය |
|---|---|---|
| **ABC බැංකුව** | මිලියන 40 | 16% |
| **PQR බැංකුව** | මිලියන 15 | 18% |

ඉදිකිරීමේ කටයුතු සිදුකිරීම සඳහා වැයකරන ලද මුළු පිරිවැය රු. මිලියන 50 කි. ණය මුදල් භාවිත කරනු ලබන තෙක් එම ණය මුදල් ආයෝජනවල යෙදවීම මඟින් 2023 මාර්තු 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය තුළදී රු. මිලියන 1.1 ක පොලී ආදායමක් උපයා ඇත. 2023 අප්‍රේල් 01 දින සිට ණය මුදලේ ප්‍රාග්ධන ආපසු ගෙවීම් සිදුකර ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 23 - ණය ගැනුම් පිරිවැය ප්‍රමිතයට අනුව, 2023 මාර්තු 31 දිනට ගොඩනැගිල්ල මත ප්‍රාග්ධනිත කළ යුතු ණය ගැනුම් පිරිවැය **ගණනය කරන්න**. (ලකුණු 06)

(b) පහත සඳහන් යෙදුම්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 37 - ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම් ප්‍රමිතයට අනුව **පැහැදිලි කරන්න**:

(i) බැඳීමක් ඇති කරන සිද්ධියක් (An obligating event).

(ii) ප්‍රතිපාදනයක් (A provision). (ලකුණු 04)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 50)

### 08 වන ප්‍රශ්නය

**සීමාසහිත රිවඩ් පොදු සමාගමේ** ගිණුම් පොත්වලින් 2023 මාර්තු 31 දිනට, පහත සඳහන් ශේෂ පිරික්සුම උපුටාගෙන ඇත:

**සීමාසහිත රිවඩ් පොදු සමාගම**

**2023 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම** *(රු.'000)*

| | හර | බැර |
|---|---|---|
| **දේපළ, පිරියත සහ උපකරණ, පිරිවැයට:** | | |
| ඉඩම | 70,000 | |
| ගොඩනැගිල්ල | 45,000 | |
| යන්ත්‍ර | 44,000 | |
| මෝටර් වාහන | 17,000 | |
| **2022 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය:** | | |
| ගොඩනැගිල්ල | | 16,000 |
| යන්ත්‍ර | | 8,500 |
| මෝටර් වාහන | | 6,000 |
| 2023 මාර්තු 31 දිනට තොගය, පිරිවැයට | 47,000 | |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් / වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 16,500 | 6,500 |
| අතැති මුදල් සහ බැංකුවේ ඇති මුදල් | 20,975 | |
| 2022 අප්‍රේල් 01 දිනට වෙළෙඳ ලැබිය යුතු මුදල් සඳහා වූ ප්‍රතිපාදනය | | 1,400 |
| සේවක ප්‍රතිලාභ (පාරිතෝෂික ප්‍රතිපාදනය) | | 9,100 |
| ඉදිරියට කළ ගෙවීම් | 12,000 | |
| විකුණුම් පිරිවැය / විකුණුම් | 134,000 | 295,000 |
| වෙනත් ආදායම් | | 7,100 |
| ගෙවූ ආදායම් බදු | 12,400 | |
| 2022 අප්‍රේල් 01 දිනට ගෙවිය යුතු ආදායම් බදු | | 3,250 |
| පරිපාලන වියදම් | 35,000 | |
| බෙදාහැරීමේ වියදම් | 27,000 | |
| මූල්‍ය වියදම් | 8,500 | |
| කල්බදු ගෙවීම් | 2,975 | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 12,000,000) | | 120,000 |
| 2022 අප්‍රේල් 01 දිනට රඳවාගත් ඉපැයීම් | | 19,500 |
| | **492,350** | **492,350** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2023 මාර්තු 31 දින, සමාගමේ ඉඩම රු. මිලියන 75 කට ප්‍රත්‍යාගණනය කර ඇති අතර, මේ සම්බන්ධයෙන් කිසිදු සටහනක් වාර්තා කර නොමැත.

(2) දේපළ, පිරියත සහ උපකරණ, පිරිවැය මත, සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබන අතර, එම වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය පහත සඳහන් පරිදි වේ:

| | | |
|---|---|---|
| ගොඩනැගිල්ල | : | වර්ෂ 50 |
| යන්ත්‍ර | : | වර්ෂ 05 |
| මෝටර් වාහන | : | වර්ෂ 05 |

(3) 2022 අප්‍රේල් 01 දින, රු. මිලියන 15 ක පිරිවැයකට සමාගම විසින් නව ට්‍රක් රථයක් මිලටගෙන ඇත. එම පිරිවැයෙන් රු. මිලියන 7 ක් සමාගමේ අරමුදල් මගින් ගෙවා ඇති අතර, එය මෝටර් රථ ගිණුමෙහි වාර්තාකර ඇත. ඉතිරි මුදල සඳහා, සමාගම කල්බදු පහසුකමක් ලබාගෙන ඇත. කල්බදු වාරික වර්ෂ අවසානයේදී වාර්ෂිකව ගෙවනු ලබන අතර, වාර්ෂික කල්බදු වාරිකය රු.2,975,000/- ක් වේ. කල්බදු කාලය වර්ෂ 5 ක් වන අතර, වාර්ෂික ව්‍යංග පොලී අනුපාතිකය 25% ක් වේ. කල්බදු කාලසීමාව අවසානයේදී ට්‍රක් රථයේ හිමිකම සමාගම වෙත මාරු වේ. ගෙවන ලද කල්බදු වාරිකය "කල්බදු ගෙවීම්" යටතේ වාර්තාකර ඇති අතර, මේ සම්බන්ධයෙන් ගිණුම් පොත්වල වෙනත් කිසිදු ගිණුම් සටහනක් තබා නොමැත.

(4) රු.3,800,000/- ක් පිරිවැය වූ තොග ඒකක 1,000 ක ප්‍රමාණයක් සෙමින් චලනය (slow moving) වන බව සොයාගෙන තිබූ අතර, මෙය 2023 මාර්තු 31 දිනට තොග ශේෂය තුළ ඇතුළත්ව ඇත. මෙම තොගය, 2023 අප්‍රේල් මස විකුණුම් මිලෙන් 50% ක වට්ටමකට යටත්ව විකුණන ලදී. ඒකකයක විකුණුම් මිල රු.6,000/- ක් බැගින් වේ.

(5) පසුගිය මූල්‍ය වර්ෂයේදී, බොල්ණය වශයෙන් කපා හරින ලද රු.800,000/- ක මුදලක්, වර්ෂය තුළදී සමාගම විසින් අපසු අයකරගෙන ඇත. මෙම මුදල, මුදල් ගිණුමට හර කර, වෙළෙඳ ලැබිය යුතු මුදල් ගිණුමට බැර කර ඇත. තවද, 2023 මාර්තු 31 දිනට පැවති ඉතිරි වෙළෙඳ ලැබිය යුතු මුදල් ශේෂයෙන්, 4% ක ප්‍රතිපාදනයක් පවත්වාගෙන යාමට කළමනාකාරිත්වය විසින් තීරණය කර ඇත.

(6) 2022 අප්‍රේල් 01 දිනට, උපචිත ආදායම් බදු වගකීම රු.3,250,000/- වූ අතර, 2022/23 තක්සේරු වර්ෂය සඳහා වන සම්පූර්ණ ආදායම් බදු වගකීම රු.6,250,000/- ක් වෙතැයි ඇස්තමේන්තු කර ඇත. 2022/23 තක්සේරු වර්ෂය තුළදී ගෙවන ලද සියලුම ආදායම් බදු ගෙවීම් "ගෙවූ ආදායම් බදු" ගිණුමට අයකර ඇත.

(7) 2022/23 මූල්‍ය වර්ෂය සඳහා වන විගණන ගාස්තු වන රු.500,000/- ගිණුම්ගත කර නොමැති අතර, ඉදිරියට ගෙවූ වියදම් ගිණුමේ නිරූපණය වන්නේ 2023 සම්පූර්ණ ලිත් වර්ෂය සඳහා ගෙවන ලද වරිපනම් ගාස්තු වේ.

(8) මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා වන අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය 2023 මැයි 31 දින ලබාදෙන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ප්‍රසිද්ධ කිරීමට සුදුසු ආකාරයෙන්, **සීමාසහිත රිවඩ් පොදු සමාගමේ** පහත සඳහන් දෑ, **පිළියෙල කරන්න**:

(a) 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ'ලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය (විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය). (ලකුණු 10)

(b) 2023 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 08)

(c) 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධයේ වෙනස්වීම් දැක්වෙන ප්‍රකාශනය. (ලකුණු 03)

(d) 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දේපළ, පිරියත සහ උපකරණවල වෙනස්වීම් දැක්වෙන සටහන. (ලකුණු 04)

(මුළු ලකුණු 25)

## **09** වන ප්‍රශ්නය

**සීමාසහිත රජරට සමාගමේ** 2023 මාර්තු 31 සහ 2022 මාර්තු 31 දිනවලට / දිනෙන් අවසන් වර්ෂ සඳහා වන මූල්‍ය ප්‍රකාශනවලින් පහත සඳහන් තොරතුරු උපුටාගෙන ඇත:

**සීමාසහිත රජරට සමාගම**

**ආදායම් ප්‍රකාශනයේ උද්ධෘතය** *(රු.'000)*

| **මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා** | **2023** |
|---|---|
| විකුණුම් | 360,000 |
| විකුණුම් පිරිවැය | (223,200) |
| දළ ලාභය | 136,800 |
| පොලී සහ බදු පෙර ලාභය | 36,000 |
| පොලී වියදම | (12,500) |
| බදු පෙර ලාභය | 23,500 |
| බදු පසු ලාභය | 18,095 |

**සීමාසහිත රජරට සමාගම**

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශනවල උද්ධෘතයන්** *(රු.'000)*

| **මාර්තු 31 දිනට** | **2023** | **2022** |
|---|---|---|
| **ජංගම වත්කම්:** | | |
| තොග | 48,000 | 40,000 |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 27,000 | 26,000 |
| මුදල් සහ මුදල්වලට සමාන දෑ | 7,200 | 6,400 |
| **ස්කන්ධය:** | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් මිලියන 10) | 100,000 | 100,000 |
| රඳවාගත් ඉපැයීම් | 48,880 | 33,785 |
| **ජංගම නොවන වත්කම්:** | | |
| දිගුකාලීන ණය | 16,000 | 24,000 |
| **ජංගම වගකීම්:** | | |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 42,000 | 31,000 |
| ගෙවිය යුතු ආදායම් බදු | 7,200 | 5,700 |
| | | |

පහත සඳහන් කර්මාන්ත සාමාන්‍යයන්ද ගණනය කර ඇත:

| | |
|---|---|
| ජංගම අනුපාතය | වාර 2 |
| ක්ෂණික වත්කම් අනුපාතය | වාර 0.9 |
| තොග රඳවා ගැනීමේ කාලය | දින 55 |
| ණයගැති එකතුකිරීමේ කාලය | දින 30 |

*විකුණුම්වලින් 80% ක් හා සියලුම ගැනුම් ණය පදනම මත සිදුකරන්නේයැයි උපකල්පනය කරන්න.*

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඉහත සඳහන් තොරතුරු මත පදනම්ව, 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා / අවසන් දිනට **සීමාසහිත රජරට සමාගමේ** පහත සඳහන් අනුපාත **ගණනය කරන්න**:

(i) දළ ලාභ අනුපාතය.

(ii) ජංගම අනුපාතය.

(iii) ක්ෂණික වත්කම් අනුපාතය.

(iv) ණයගැති එකතුකිරීමේ කාලය.

(v) තොග රඳවා ගැනීමේ කාලය.

(vi) තෝලන අනුපාතය.

(vii) පොලී ආවරණය.

(viii) ලාභාංශ ආවරණය. (ලකුණු 08)

(b) කර්මාන්තයේ සාමාන්‍යයන් සමඟ 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා / අවසන් දිනට **සීමාසහිත රජරට සමාගමේ** කාර්යක්ෂමතාවය සහ ද්‍රවශීලතාවය **විශ්ලේෂණය කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 12)

## 10 වන ප්‍රශ්නය

2022 අප්‍රේල් 01 දින **සීමාසහිත අමිතා පොදු සමාගම** විසින් **සීමාසහිත සමිතා පොදු සමාගමේ** සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනයෙන් 80% ක් රු. මිලියන 500 ක මුදලකට අත්පත්කර ගන්නා ලදී. එදිනට **සීමාසහිත සමිතා පොදු සමාගමේ** හඳුනාගන්නා ලද ශුද්ධ වත්කම්වල සාධාරණ වටිනාකම රු. මිලියන 600 ක්ද, පාලනය නොවන හිමිකමෙහි සාධාරණ අගය රු. මිලියන 140 ක්ද විය.

**සීමාසහිත අමිතා පොදු සමාගමේ** සහ **සීමාසහිත සමිතා පොදු සමාගමේ** 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශ පහත පරිදි වේ:

**2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**විස්තීර්ණ ආදායම් ප්‍රකාශය** *(රු.'000)*

| | **සීමාසහිත අමිතා පොදු සමාගම** | **සීමාසහිත සමිතා පොදු සමාගම** |
|---|---:|---:|
| විකුණුම් | 1,050,000 | 550,000 |
| විකුණුම් පිරිවැය | (651,000) | (330,000) |
| **දළ ලාභය** | **399,000** | **220,000** |
| **වෙනත් ආදායම්:** | | |
| කළමනාකරණ ගාස්තු | 24,000 | |
| පොලී ආදායම | 25,000 | - |
| මෝටර් රථ ඉවත් කිරීමෙන් ඇති වූ ලාභ | 42,000 | 14,500 |
| **වියදම්:** | | |
| බෙදාහැරීමේ වියදම් | (109,000) | (79,000) |
| පරිපාලන වියදම් | (135,000) | (95,000) |
| මූල්‍ය වියදම් | (45,000) | (6,000) |
| **බදු පෙර ලාභය** | **201,000** | **54,500** |
| ආදායම් බදු | (12,500) | (8,400) |
| **වර්ෂය සඳහා ලාභය** | **188,500** | **46,100** |
| වෙනත් විස්තීර්ණ ආදායම | 14,000 | 16,000 |
| **මුළු විස්තීර්ණ ආදායම** | **202,500** | **62,100** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) වර්ෂය තුළදී, **සීමාසහිත සමිතා පොදු සමාගම** විසින් රු. මිලියන 120 ක් පිරිවැය වූ භාණ්ඩ, පිරිවැය මත 20% ක ලාභාන්තිකයක් සහිතව **සීමාසහිත අමිතා පොදු සමාගමට** විකුණා ඇත. **සීමාසහිත සමිතා පොදු සමාගම** වෙතින් මිලදී ගන්නා ලද රු. මිලියන 45 ක් වටිනා තොගයක් 2023 මාර්තු 31 දිනට නොවිකිණී **සීමාසහිත අමිතා පොදු සමාගමේ** ගබඩාව තුළ ඉතිරිව ඇත.

(2) කළමනාකාරිත්ව උපදේශක සේවා සැපයීම වෙනුවෙන් **සීමාසහිත සමිතා පොදු සමාගම** විසින් **සීමාසහිත අමිතා පොදු සමාගම** වෙත, වර්ෂය තුළදී, මාසිකව කළමනාකාරිත්ව ගාස්තු වශයෙන් රු.2,000,000/- ක් බැගින් ගෙවා ඇත.

(3) 2022 අප්‍රේල් 01 දින, **සීමාසහිත අමිතා පොදු සමාගම** විසින් බෙදාහැරීමේ රථයක් **සීමාසහිත සමිතා පොදු සමාගමට** රු.10,000,000/- ක මුදලකට විකුණනු ලැබූ අතර, විකුණනු ලැබූ දිනට **සීමාසහිත අමිතා පොදු සමාගමේ** පොත්වල රු.8,000,000/- ක ධාරණ අගයක් එම රථයට තිබුණි. 2022 අප්‍රේල් 01 දින බෙදාහැරීමේ රථයේ ඉතිරි ප්‍රයෝජනවත් ආයු කාලය වර්ෂ 5 කි.

(4) **සීමාසහිත සමිතා පොදු සමාගමේ** කාරක ප්‍රාග්ධන අවශ්‍යතා වෙනුවෙන් **සීමාසහිත අමිතා පොදු සමාගම** විසින් ලබාදුන් ණය මුදලට අදාලව **සීමාසහිත සමිතා පොදු සමාගමෙන්** ලැබුණු රු. මිලියන 5 ක පොලිය, පොලී ආදායම තුළ ඇතුළත් වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **සීමාසහිත සමිතා පොදු සමාගම** අත්පත් කර ගැනීම මත ඇති වූ කීර්තිනාමය **ගණනය කරන්න**. (ලකුණු 03)

(b) 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය **පිළියෙල කරන්න**.

(ලකුණු 10)
(මුළු ලකුණු 13)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | **සඳහන් කරන්න** | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | **හඳුනා දක්වන්න** | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | **හඳුනාගන්න** | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | **අර්ථකතනය කරන්න** | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | **විස්තර කරන්න** | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | **පැහැදිලි කරන්න** | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැළපීම. | **සසඳන්න** | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | **පිළියෙල කරන්න** | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | **ප්‍රදර්ශනය කරන්න** | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | **සන්නිවේදනය කරන්න** | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **සමානකම් බලන්න** | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **විමසන්න** | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |